අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/60/16/2022
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2022.06. 24

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරු වෙත,

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරිම.**

අංක 1885/31 හා 2014.10.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට 2016 වර්ෂයේ බඳවා ගන්නා ලද නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. **ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්**

පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධරයන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(i) සේවයේ ස්ථිර කර තිබීම

(ii) උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර 06ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක 06ක් උපයාගෙන තිබීම.

(iii) නියමිත දිනට 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

(iv) අනෙක් රාජ්‍ය භාෂාව සමත්ව හෝ ඉන් නිදහස් කරනු ලැබ සිටීම.

(v) සන්ධාන භාෂාව සමත්ව හෝ ඉන් නිදහස් කරනු ලැබ සිටීම.

(vi) අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(vii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

(viii) ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 1 සමත් වී තිබීම.

03. (i). ඉහත 02හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති ජාතික පාසල්වල සේවයේ නියුතු නිලධාරීන් මේ සමඟ වන ආකෘතිය අනුව (ඇමුණුම 01) සම්පූර්ණ කරන ලද අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව ද,

(ii). ඉහත 02හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් මේ සමඟ වන ආකෘතිය අනුව (ඇමුණුම 01) සම්පූර්ණ කරන ලද අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ හා පළාත් අධ්‍යාපන ලේකම්ගේ නිර්දේශ සහිතව ද,

" සහකාර ලේකම්, විදුහල්පති ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල," යන ලිපිනයට යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

04. තවද, ඔබ පළාත තුළ සේවයේ නිරත සියලුම විදුහල්පති ශ්‍රේණිධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථා සංශෝධන සහ ඔවුන්ගේ උසස්වීම් සඳහා අයදුම් කළ යුතු ක්‍රමවේදය පිළිබඳව , දැනුවත් කරන මෙන් දන්වන අතර අදාළ ඉල්ලුම්පත සහ උසස්වීම් ආකෘතිපත්‍රය www.moe.gov.lk ඔස්සේ බාගත කළ හැකි බව ද වැඩිදුරටත් දන්වමි.

එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත්:

01. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ , .......................... පළාත - කරු. අ.ක.ස. හා දැ.ගැ.ස

02. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, ....................................... - කරු. අ.ක.ස. හා දැ.ගැ.ස